
# අශ්ව පැටියාගේ අලුත් යාලුවා



# අශ්ව පැටියාගේ අලුත් යාලුවා

2023

කතෘ ප්‍රකාශනයකි

කතාව සහ චිත්‍ර:

W. මනුදි රිත්මලී වීරපටබැඳි

2 ශ්‍රේණිය E

මහාමායා බාලිකා විදුහල

2023.11.15

කතෘගේ වෙනත් කෘති

- කැලෑ ගමේ සෙල්ලම් ඉස්කෝලේ
- ඇස් ලොකු බණ්ඩා
- සමනල පැංචිගේ මල් නැතිවෙලා
- කොළ පාට එළිය

# **පිදුම**

## මහාමායා පාසල් මැණීයන්ට

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

2023.11.15



එක කැලේක අශ්ව රංචුවක් ජීවත් වුණා. ඒ රංචුවේ අශ්ව අම්මෙකුයි පැටියෙකුයි හිටියා. අශ්ව පැටියා හරිම සතුටින් සෙල්ලම් කරමින් හිටියා.

එක පාරටම එයා දැක්කා අහසේ ලස්සන දේදුන්නක් පායනවා. එයා දේදුන්න දිහා බලාගෙන හිටියා.



දේදුන්න දිගේ කවුදෝ එනවා වගේ එයා දැක්කා. හරියට අශ්වයෙක් වගේ. එයා තවත් හොඳට බැලුවා. අශ්ව පැටියෙක් වගේම තමයි.



අශ්ව පැටියා අම්මා ළඟට දිව්වා. "අම්මේ, අම්මේ, අර කවුද?" එයා ඇහුවා. "හරිම පුදුමයක්නේ පුතේ. ඒ කඟවේනෙක්." "කවුද අම්මෙ ඒ? එයා අශ්වයෙක් වගේනේ." "ඔව්. ඒ උනාට එයාගේ නළලේ අඟක් තියෙනවා. පියාපත් දෙකකුත් තියෙනවා."



දේදුන්න උඩ හිටිය කඟවේනා පියාඹලා ඇවිත් අශ්ව පැටියා ළඟ නතර වුණා. “මම ආවේ ඔයා එක්ක සෙල්ලම් කරන්න.” එයා කිව්වා.



"ඔයාගෙ නම මොකක්ද?" අශ්ව පැටියා ඇහුවා.

"මගේ නම දේදුනු. ඔයාගේ නම මොකක්ද?"

"මගේ නම කළු ඇස්. අපි දෙන්නා හොඳ යාලුවෝ වෙමු."



“ඔයා ඉන්නේ අහසෙද? තනියමද ඉන්නේ?” කළු ඇස් ඇහුවා.

“නෑ මං ඉන්නේ අම්මත් එක්ක. අහසේ වලාකුළු වලට උඩින්. අපි ඉන්නේ ලස්සන තැනක. ඒත් මට එහෙ සෙල්ලම් කරන්න කවුරුත් නෑ”



"මං දැක්කා ඔයා සතුටින් සෙල්ලම් කරනවා. ඔයත් එක්ක සෙල්ලම් කරන්නයි මං ආවේ. එන්න අපි සෙල්ලම් කරමු." දේදුනු කිව්වා.

ඒ දෙන්නා සතුටින් සෙල්ලම් කළා.



කාලය ගත වෙනවා එයාලට දැනුනේ නෑ. හොඳටම හැන්දෑ වුණා. එකපාරටම අහසින් එළියක් විහිදුනා. තවත් දේදුන්නක් පායලා. දෙන්නම ඒ දිහා බැලුවා. "දේදුනු මෙහෙ එන්න." කටහඬක් ඇහුණා.



“ඒ මගේ අම්මා. මම දැන් යන්න ඕන. මම හෙටත් එන්නම් සෙල්ලම් කරන්න. එහෙනම් මම ගිහින් එන්නම්, කළු ඇස් යාළුවේ.”

දේදුනු පියාඹන හැටි කළු ඇස් බලාගෙන හිටියා. එයාට හරි සතුටුයි.





පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20